# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2102/2 - 2018 දෙසැම්බර් මස 17 වැනි සඳුදා - 2018.12.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

ජනා.කා.අංකය : පීඑස්/සීඑස්ඒ/00/1/14/1

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමන් විසිනි**

මුද්‍රාව

මෛත්‍රීපාල සිරිසේන

1. ගරු අනිල් ගුණරත්න මැතිතුමා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විශ්‍රාමලත් විනිශ්චයකාර
2. ගරු ඇතාලඩ ආරච්චිගේ ගාමිණී රෝහන් අමරසේකර මැතිතුමා, අභියාචනාධිකරණයේ විනිශ්චයකාර
3. ගරු පියසේන රණසිංහ මැතිතුමා, මහාධිකරණයේ විශ්‍රාමලත් විනිශ්චයකාර
4. මල්ලවආරච්චිගේ දොන් ඇන්තනි හැරල්ඩ් මැතිතුමා, විශ්‍රාමලත් නියෝජ්‍ය විගණකාධිපති
5. වසන්තා ජයසීලි කපුගම ගීගනගේ මෙනවිය, ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්

වෙත,

සුභාශිංසන පූර්වකවයි !

පරීක්ෂණ කොමිෂන් සභා පනතේ (393 වැනි අධිකාරය වූ) 2 වැනි වගන්තියේ විධිවිධානයන්ට අනුකූලව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන වන මවිසින් 2018 ක් වූ ජනවාරි මස 31 වැනි දිනැති අධිකාර පත්‍රය මගින්, සී/ස. ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් සමාගම, සී/ස. ශ්‍රී ලංකන් කේටරිං සමාගම සහ සී/ස. මිහින් ලංකා (පුද්ගලික) සමාගම සම්බන්ධයෙන් සිදු කරන ලදැයි කියන අක්‍රමිකතා පිළිබඳව විමර්ශනය හා පරීක්ෂණය කිරීමේ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් පිහිටුවනු ලැබ ඇති හෙයින් ද,

මෙම පරීක්ෂණයන් හා විමර්ශනයන් හී දී, පැවරී ඇති කාර්යය භාරය ඵලදායීව ඉටු කිරීම සඳහා කොමිෂන් සභාව වෙත අතිරේක බලතල අවශ්‍ය බවට කොමිෂන් සභාව විසින් ඉල්ලීමක් කරනු ලැබ ඇති හෙයින් ද,

2008 අංක 16 දරන පනතින් සංශෝධිත පරීක්ෂණ කොමිෂන් සභා පනතෙහි (393 වන අධිකාරිය) 8 (1) (අ) වගන්තිය යටතේ නිශ්චිත වශයෙන් දක්වා ඇති බලතල ද මෙම කොමිෂන් සභාව වෙත මවිසින් තවදුරටත් පවරා දෙනු ලබන බව මෙයින් දන්වා සිටිමි.

ඔබතුමන්ලා ගේ විචක්ෂණභාවය, සාමර්ථ්‍යය හා පක්ෂපාතීත්වය ගැන මහත්වූ භක්තිය හා විශ්වාසය තබමින් පූර්වෝක්ත අධිකාර පත්‍රය මගින් පිහිටුවනු ලැබූ පරීක්ෂණ කොමිෂන් සභාවේ එකී අධිකාරී පත්‍රයෙහි දක්වා ඇති කාර්යයන් ක්‍රියාවට නංවනු පිණිස අවශ්‍ය විය හැකි සියළුම පියවර ගන්නා මෙන් ඔබතුමන්ලාට මම මෙයින් නියම කරමි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ වර්ෂ දෙදහස් දහඅටක් වූ දෙසැම්බර් මස 12 වන දින වූ මෙදින කොළඹ දී දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

උදය ආර්. සෙනෙවිරත්න,
ජනාධිපති ලේකම්.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.